ආරක්ෂක අමාත්‍යාංශය
பாதுகாப்பு அமைச்சு
MINISTRY OF DEFENCE

ආපදා කළමනාකරණ අංශය
அனர்த்த முகாமைத்துவ பிhpவு
DISASTER MANAGEMENT SECTION

ලේකම්
செயலாளர்
Secretary

දු.අ.
தொ.எ 0112381154
T.N.
වි.තැ.
மி.அ. மு secdefence@defence.lk
Email

ආපදා කළමනාකරණ අංශය
அனர்த்த முகாமைத்துவ பிhpவு
Disaster Management Section

දු.අ.
தொ.எ 0112665170
T.N.
ෆැක්ස්
பெக்ஸ் 0112665170
Fax
වි.තැ.
மி.அ.மு secretarymdm2015@gmail.com
Email

විද්‍යා මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව வித்யா மாவத்தை , கொழும்பு 07, இலங்கை Vidya Mawatha, Colombo 07, Sri


මගේ අංකය
எனது இல
My No.
NDRSC/1/2/1

දිනය
திகதி
Date
2020.05. 15

ආපදා කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2020

**සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,**
**දෙපාර්තමේන්තු ප්‍රධානීන්,**
**සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන්,**
**සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.**

<u>හදිසි ආපදා තත්ත්වයකදී විපතට පත් ජනතාව හා ආපදා අවදානම හේතුවෙන් පදිංචි වාසස්ථානවලින් ඉවත් කරන ජනතාවට සහන සැලසීම හා හානියට පත් ප්‍රදේශ යථා තත්ත්වයට පත්කිරීම සඳහා වන උපදෙස්</u>

ස්වාභාවික ආපදා තත්ත්වයකදී පීඩාවට පත් වන ජනතාවට කඩිනම් සහන සැලසීම යන මැයෙන් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2020.04.22 රැස් වූ අමාත්‍ය මණ්ඩලය ජාතික රක්ෂණ භාර අරමුදල හරහා මෙතෙක් ක්‍රියාත්මක වූ රක්ෂණාවරණ ක්‍රමවේදය වෙනුවට වඩාත් ඵලදායී හා කාර්යක්ෂම ආකාරයෙන් වන්දි සැලසීමේ අරමුණින් ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍යාංශය යටතේ ඇති ජාතික සහන සේවා මධ්‍යස්ථාන මගින් දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් හරහා වන්දි ගෙවීමට තීරණය කර ඇත.

02. හදිසි ආපදා තත්ත්වයකදී ජනතාවට සහන සැලසීම හා හානියට පත් ප්‍රදේශ යථා තත්ත්වයට පත්කිරීම අරමුණ කොට නිකුත් කරනු ලබන මෙම චක්‍රලේඛය 2020.04.01 දින සිට බලපැවැත් වේ. මේ පිළිබඳව මීට පෙර ක්‍රියාත්මක වූ , මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2016, 03/2016(I) හා 03/2016(II) උක්ත අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව මෙයින් අවලංගු වේ.

03. හදිසි ආපදා තත්ත්වයකදී කඩිනම් සහන සැලසීම හා දේපළ හානි සඳහා වන්දි ලබාදීමට ක්‍රියාත්මක වූ රක්ෂණාවරණ වැඩසටහන 2020.03.31 දිනෙන් අවසන් වන අතර, මෙම චක්‍රලේඛයේ 04 වන ඡේදයේ දක්වා ඇති ස්වාභාවික ආපදාවකදී ජීවිතක්ෂයට පත්වන, අවතැන් වන හා දේපළ හානි වන ජනතාව සඳහා සහන සැලසීම 2020.04.01 දින සිට මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන යොදාගනිමින් ක්‍රියාත්මක වේ. ඒ අනුව ආපදා කළමනාකරණ විෂය භාර අමත්‍යාංශය යටතේ ඇති, ආපදා කළමනාකරණ අංශය, ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය හා දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකක සම්බන්ධීකරණය කරගනිමින් ආපදා තත්ත්වයන්හිදී හදිසි ප්‍රතිචාර දැක්වීම හා ආපදාවෙන් බලපෑමට ලක්වන පුද්ගලයන් සඳහා කඩිනම් සහන සැලසිමට හා හානියට පත්වන දේපළ සඳහා වන්දි ලබා දීමට ප්‍රාදේශීය ලේකම්වරුන් හා දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් අවශ්‍ය පියවර ගත යුතුය.

04. මෙම චක්‍රලේඛය යටතේ ගංවතුර, සුළි සුළං, නායයෑම්, කුණාටු, චණ්ඩ මාරුත, සැඩ කුණාටු, භූමි කම්පා, සුනාමි, අකුණු සැර, අනපේක්ෂිතව යම් දෙයක් වැටීම, තද සුළඟ නිසා ගස් කඩා වැටීම, වර්ෂාවෙන් තාප්ප කඩා වැටීම සහ ඊට සමාන වෙනත් ස්වාභාවික ආපදා හේතුකොට ගෙන සිදුවන සියලුම ජීවිත හා දේපල හානි සඳහා වන්දි ලබාදීමට කටයුතු කළ යුතුය.

**05.** ඉහත 04 වන ඡේදයේ සඳහන් ස්වාභාවික ආපදාවකදී විපතට පත්වන පවුල්/පුද්ගලයන් හා හානියට පත්වන දේපළ සඳහා පහත පරිදි කඩිනම් සහන සැලසීම හා වන්දි ලබා දීම සිදු කළ හැකිය.

**(i) <u>ජීවිත හානි</u>**

ස්වාභාවික ආපදාවක් හේතුවෙන් සිදුවන ජීවිත හානි සඳහා එක් පුද්ගලයෙකු වෙනුවෙන් රුපියල් දෙලක්ෂ පනස් දහසක (රු. 250,000/-) උපරිමයකට (In case of Death) යටත්ව වන්දි ගෙවිය හැකිය.

**(ii) <u>පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වීම</u>**

ස්වාභාවික ආපදාවක් හේතුවෙන් පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වූ බවට වෛද්‍ය වාර්තාවකින් තහවුරු කෙරෙන පුද්ගලයකු වෙනුවෙන් රුපියල් දෙලක්ෂ පනස් දහසක (රු.250,000/-) උපරිමයකට යටත්ව වන්දි ගෙවිය හැකිය.

**(iii) <u>දේපළ හා නිවාස හානි</u>**

ස්වාභාවික ආපදාවක් හේතුවෙන් සිදුවන නිවාස හා දේපළ හානි වෙනුවෙන් එක් නිවසකට රුපියල් ලක්ෂ විසිපහක (රු.2,500,000/-) උපරිමයකට යටත්ව වන්දි මුදල් ගෙවිය හැකි අතර, වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන දහයට (මිලියන 10) අඩු ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට අයත් ගොඩනැගිලි හා දේපළ සඳහා ද රුපියල් ලක්ෂ විසිපහක (රු.2,500,000/-) උපරිමයකට යටත්ව වන්දි මුදල් ගෙවිය හැකිය.

දේපළ හානි වෙන වෙනම ගණනය කොට අනුමත සීමාවන් තුල ගෙවීම් කල යුතු අතර මේ පිළිබඳව ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍යාංශය විසින් නිකුත් කරන මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතුය.

**(iv) <u>පිසූ ආහාර</u>**

සියලුම දිසාපතිවරුන්/ දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් හදිසි ආපදා තත්ත්වයකදී තම පදිංචි වාසස්ථානවලින් ඉවත් කරන ජනතාවට කඩිනම් සහන සැලසීම හා ජන ජීවිතය යථා තත්ත්වයට පත්කිරීම සඳහා අවශ්‍ය සහන සැලසීමට ක්‍රියා කළ යුතුය.

ඒ අනුව, ආපදා තත්ත්වයකදී ආපදාවට ලක්වී තම ස්ථිර පදිංචි ස්ථානවලින් ඉවත් කර සුරක්ෂිත මධ්‍යස්ථානවල රඳවා ඇති පුද්ගලයන් හා තම නිවාසවල පිසූ ආහාර පිළියෙල කරගැනීමට නොහැකි ලෙස නිවාස ආපදාවෙන් බලපෑමට ලක්වී ඇති පුද්ගලයන් සියලුදෙනාටම ආදායම් මට්ටම නොසලකා පිසූ ආහාර සැපයිය යුතුය. ඒ සඳහා, එක් පුද්ගලයෙකු වෙනුවෙන් දිනකට රුපියල් 300/- ක උපරිමයකට යටත්ව වියදම් දැරිය හැකිය.

ප්‍රාදේශීය ලේකම්වරයාට සිය අභිමතය පරිදි දින 03ක උපරිමයක් දක්වා පිසූ ආහාර ලබාදීමට හැකි අතර, එතැන් සිට ඉදිරියට දින 4ක් දිසාපති/දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය මත පිසූ ආහාර ලබාදිය හැක. එතැන් සිට ඉදිරියට තවත් දින 7ක කාලයක් දක්වා පිසූ ආහාර ලබාදීමට අවශ්‍ය නම් ඒ සඳහා ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය

**(v) <u>වියළි ආහාර ලබාදීම</u>**

ආපදා තත්ත්වයකදී සුරක්ෂිත මධ්‍යස්ථානවලට නොපැමිණ ඥාතීන්ගේ හෝ හිතවතුන්ගේ නිවෙස්වල රැඳී සිටින පවුල්වලට එම නිවෙස්වල ආහාර පිළියෙල කරගත හැකි බැවින් එම පවුල් සඳහා පිසූ ආහාර ලබාදෙන කාල පරාසයට සමාන කාල පරාසයකට වියළි සලාකයක් ලබාදිය හැකිය.

ආපදාවේ බලපෑම අවසන් වූ වහාම සුරක්ෂිත මධ්‍යස්ථානවල රඳවා සිටි පුද්ගලයන්/පවුල් තම නිවෙස්වලට පිටත් කර යැවිය යුතු අතර ඔවුන්ගේ ජන ජීවිතය යථාවත් කරගැනීම සඳහා අවශ්‍යතාවය අනුව සතියක කාලයක් දක්වා වියළි සලාකයක් ලබාදීම සිදුකළ හැකිය.

ඥාතීන්ගේ හෝ හිතවතුන්ගේ නිවෙස්වල රැඳී සිට ආපදාවේ බලපෑම අවසන් වූ වහාම තම නිවෙස්වලට යන පුද්ගලයන්/ පවුල් සඳහාද ඔවුන්ගේ ජන ජීවිතය යථාවත් කරගැනීම සඳහා අවශ්‍යතාවය අනුව සතියක කාලයක් දක්වා වියළි සලාකයක් ලබාදීම සිදුකළ හැකිය.

ආපදාවට ලක්වූ පුද්ගලයන්/ පවුල් වෙත සතියකට වඩා වැඩි කාලයක් සඳහා වියළි ආහාර ලබාදිය යුතු අවස්ථාවකදී ආපදා සිද්ධි වාර්තාව සමඟ අදාළ ඉල්ලීම ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර ඒ සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

**වියළි සලාක වෙනුවෙන් සතියකට වැය කල හැකි උපරිම මුදල**

| | රුපියල් |
|---|---|
| තනි පුද්ගලයකු සඳහා | 900 |
| සාමාජිකයන් 02 කින් යුත් පවුලකට | 1,200 |
| සාමාජිකයන් 03 කින් යුත් පවුලකට | 1,400 |
| සාමාජිකයන් 04 කින් යුත් පවුලකට | 1,600 |
| සාමාජිකයන් 05 කින් යුත් පවුලකට | 1,800 |

වියළි සලාක ලබා දීම සඳහා විවිධ සේවා සමුපකාර සහ සතොස අලෙවිසැල් වලින් සෘජුවද, එයට අමතරව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යටතේ මිල ගණන් කැඳවා බාහිර සැපයුම්කරුවන්ගෙන්ද මිලදී ගැනීම් සිදු කල හැකිය.

**05.1. සහන සැලසීමට අනුගමනය කලයුතු ක්‍රමවේදය :**

i. සියලු ආපදා තත්ත්වයන් කළමනාකරණය කර ගැනීමට හා හදිසි ආපදා තත්ත්වයකදී විපතට පත්වූවන් සඳහා මෙන්ම, ආපදා අවදානම් තත්ත්වයක් ඇතිවීම හේතුවෙන් අවතැන්වන පුද්ගලයන් සඳහා ද, ඉතා කඩිනමින් සහන සැලසීමට දිස්ත්‍රික් ලේකම්වරුන්/ප්‍රාදේශීය ලේකම්වරුන් විසින්, ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍යාංශය යටතේ ඇති ආපදා කළමනාකරණ අංශය, ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය හා දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකක සමග සම්බන්ධීකරණය වෙමින් අවශ්‍ය පියවර ගත යුතුය.

ii. සියලු ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ආපදා තත්ත්වය ඇතිවීමත් සමග විපතට පත්වූවන් සඳහා කඩිනම් සහන සැලසීමට අවශ්‍ය කරන අත්තිකාරම් මුදල් කඩිනමින් ලබා ගැනීම සඳහා ආපදා සිද්ධි වාර්තාව සමග අවශ්‍ය අත්තිකාරම් මුදල් දිස්ත්‍රික් ලේකම්/දිසාපති මගින් ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍යාංශය යටතේ ඇති ආපදා කළමනාකරණ අංශය හා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙත දන්වා එම අංශ සමග සම්බන්ධීකරණය වෙමින් අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළ යුතුය.

iii. ආපදා තත්ත්වය සමනය වූ වහාම ආපදාවෙන් හානියට පත්වූ නිවාස, ඒවායේ දේපළ, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට අයත් ගොඩනැගිලි හා ඒවායේ දේපළ සඳහා අත්තිකාරම් සහ වන්දි මුදල් ලබාදීමට අවශ්‍ය ප්‍රතිපාදන මෙම චක්‍රලේඛය සඳහා නිකුත් කරන ලද මාර්ගෝපදේශයේ සඳහන් උපදෙස් අනුව ආපදා සිද්ධි වාර්තා හා අදාල සියලු විස්තර සමග ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් සිය දිස්ත්‍රික් ලේකම් මගින් ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍යාංශය යටතේ ඇති ආපදා කළමනාකරණ අංශය හා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙත දන්වා එම අංශ සමඟ සම්බන්ධීකරණය වෙමින් අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළ යුතුය.

**06. වෙනත් ආපදා තත්ත්වයන් සඳහා සහන සැලසීම :**

ඉහත 04 ඡේදය යටතේ සඳහන් නොවන දැඩි වියළි කාලගුණික තත්ත්වයක් හෝ නියං ආපදා තත්ත්වයක් බලපැවැත්වෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ජනතාවට පානීය ජලය සපයා ගැනීම සඳහා ප්‍රමාණවත් පහසුකම් නොමැති අවස්ථාවන්වලදී පමණක් පීඩාවට පත්වන ජනතාව සඳහා පානීය ජලය සැපයීම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සිදුකළ යුතුය.

දැඩි වියළි කාලගුණික තත්ත්වයක් හෝ නියං ආපදා තත්ත්වයක් තුල පානීය ජලය සපයා දීම සඳහා අවශ්‍ය මුදල් මහා භාණ්ඩාගාරය විසින් ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ අංශය යටතේ ඇති ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙත ලබා දීමට ක්‍රියා කරනු ඇත.

පානීය ජලය බෙදාහැරීම සඳහා යොදාගනු ලබන ජල බවුසර් රථවලට වැය වන ඉන්ධන වියදම්, රියදුරු සහ රිය සහයකයන් සඳහා ගෙවනු ලබන වැටුප්, දීමනා හා අතිකාල දීමනා සහ පානීය ජලය බෙදාදීමේදී වැයවන වෙනත් අත්‍යවශ්‍ය වියදම් දැරීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ප්‍රතිපාදන ලබාදීම සිදුකරනු ලැබේ. ඒ අනුව, දිස්ත්‍රික් ලේකම්වරුන් ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණය වෙමින් අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළ යුතුය.

මෙයට අමතරව නියං තත්ත්වයක් හේතුවෙන් අඩාල වන ජන ජීවිතය යථාවත් කිරීම සඳහා තවදුරටත් සහන සැලසිය යුතු බවට රජය විසින් තීරණය කරනු ලබන අවස්ථාවකදී ඒ සඳහා අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් පියවර ගත යුතුය.

**07. ප්‍රතිසංස්කරණ කටයුතු:**

**07.1 සුළු පරිමාණ ප්‍රතිසංස්කරණ කටයුතු:**

හදිසි ආපදා තත්ත්වයක් තුල හානියට පත් වන සුළු පරිමාණයේ ග්‍රාමීය මාර්ග , කුඩා වැව්, අමුණු, පාලම් වැනි ග්‍රාමීය යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම අදාල දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් සිදු කල යුතුය. සිදු වූ හානිය ඇස්තමේන්තු කිරීමෙන් පසු අවශ්‍ය අමතර ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් ලබා ගැනීමෙන් අනතුරුව එම කටයුතු කඩිනමින් නිම කිරීමට දිස්ත්‍රික් ලේකම්වරුන් පියවර ගත යුතුය.

**07.2 මහා පරිමාණයේ ප්‍රතිසංස්කරණ කටයුතු:**

හදිසි ආපදා තත්ත්වයකදී දිවයිනේ විවිධ දිස්ත්‍රික්කවල හානියට පත්වන මහා පරිමාණයේ යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීමේ වගකීම අදාළ රේඛීය අමාත්‍යාංශයන්ට පැවරේ. මේ සඳහා ඒ ඒ දිස්ත්‍රික්කවල හානියට පත් යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීමට යන වියදම ඇස්තමේන්තු කොට, පවත්නා ප්‍රතිපාදන තුලින් හෝ අවශ්‍ය වේ නම් මහා භාණ්ඩාගාරයෙන් අමතර ප්‍රතිපාදන ලබා ගැනීමෙන් අනතුරුව එම කටයුතු අදාල රේඛීය අමාත්‍යාංශය විසින් සිදු කල යුතුය.

**07.3 ආගමික ස්ථාන, රජයේ ගොඩනැගිලි හා පොදු ගොඩනැගිලි :**

හදිසි ආපදා තත්ත්වයකදී හානියට පත්වන ලියාපදිංචි ආගමික ස්ථාන, රජයේ ගොඩනැගිලි හා පොදු ගොඩනැගිලි යථාවත් කිරීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ මඟින් කටයුතු කළ යුතුය.

**08.** මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාවය මත නිකුත් කරනු ලැබේ. මේ පිළිබඳව තවදුරටත් පැහැදිලි කිරීමක් අවශ්‍යවන්නේ නම්, ආපදා කළමනාකරණ අංශයේ අතිරේක ලේකම්ගේ 011-2665054/011-2665123 යන දුරකථන අංකයන්ගෙන් ලබාගත හැකිය. අදාළ සහන සැලසීම මේ සමඟ නිකුත් කරන මාර්ගෝපදේශයේ උපදෙස් අනුව සිදු කළ යුතුය.

**මේජර් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න**
**ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී**
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය

<u>පිටපත්:</u>

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. ලේකම්, මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
4. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
5. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.
6. ලේකම්, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
7. විගණකාධිපති